නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing & Samurdhi

4 මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 ஆம் மாடி, செத்சிறிபாய, பத்தரமுல்ல.
4 floor, Sethsiripaya, Battaramulla.

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

මගේ අංකය / எனது இல / My No: DDD/HO/07/SD/06/WD
ඔබේ අංකය / உமது இல / Your No: ..............................
දිනය / திகதி / Date: 2015/02/26

චක්‍රලේඛ අංක 2015/04

සියලුම දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / දිස්ත්‍රික් ලේකම්වරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,

## <u>ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන - 2015.</u>

ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව 2015 වර්ෂයේදී දිවයින පුරා සිටින අඩු ආදායම්ලාභී දිරිය කාන්තාවන් ඇගයීමට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන අංශය සැලසුම් කර ඇත.

**හැඳින්වීම :-**

අධ්‍යාත්මික ගුණ වගාවෙන් සපිරි සමෘද්ධිමත් හා ගුණ ගරුක සමාජයක් ගොඩ නැගීම සඳහා යහපත් පවුල් පරිසරයක් නිර්මාණය කිරීමේදී කාන්තාවකගේ කාර්යභාරය ඉතා විශාලය. එමෙන්ම සමාජයේ යහ පැවැත්ම සඳහා කාන්තා නායකත්වයේ ඇති වැදගත්කම යලි අවධාරණය කර ගැනීම කාලීන අවශ්‍යතාවයකි. ඒ සඳහා වන විශේෂ කණ්ඩායමක් ලෙස දිවිනැගුම වැඩසටහන වටා ඒකරාශී වී ඇති අඩු ආදායම්ලාභී කාන්තාවන්ගේ දායකත්වය ලබා ගැනීමත් දැනට විවිධ වැඩසටහන්වලට යොමුව සාර්ථක මට්ටමට පැමිණ ඇති දිරිය කාන්තාවන් ඇගයීමත් කාලෝචිත වේ.

**අරමුණ :-**

- දිවිනැගුම වැඩසටහන යටතේ ජීවිතය ජයගත් දිරිය කාන්තාවන් ඇගයීම.
- දිවිනැගුම වැඩසටහන වටා ඒකරාශී වී ඇති අඩු ආදායම්ලාභී කාන්තාවන් දිරිමත් කිරීම.
- සමාජයේ යහපැවැත්ම සඳහා කාන්තා දායකත්වය සක්‍රීය කිරීම.

**ඉලක්ක ගත ප්‍රජාව :-**

- දිවිනැගුම වැඩසටහනට සම්බන්ධ වී ආර්ථික වශයෙන් සවිමත් වූ කාන්තාවන්
- දිවිනැගුම ප්‍රජා සංවිධාන ක්‍රියාවලියට සම්බන්ධ වී නායකත්වයෙන් ඉදිරියට ආ කාන්තාවන්
- සැමියා මිය ගිය හෝ හැරයාම නිසා අපහසුතාවයට හා අසාධාරණයට පත් වූ දරුවන් සමඟ ජීවිතය ජයගත් කාන්තාවන්
- දිවිනැගුම වැඩසටහනට සම්බන්ධව ව්‍යවසායකයින් ලෙස දියුණු වූ කාන්තාවන්

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர் நாயகம் / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| දුරකථන/ தொலைபேசி/Telephone: | 011-2872202 | 011-2861994 | 011-2873799 | 011-2889046 |
| ෆැක්ස්/ தொலைநகல்/Fax: | 011-2889002 | | 011-2873996 | |
| ඊ-මේල්/ மின்னஞ்சல்/ E-Mail: | dgdivineguma@gmail.com | anuradhakum@yahoo.com | hrddivineguma@gmail.com | |

**කාල වකවානු**

මෙම වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හා ජාතික මට්ටමින් 2015.03.08 දින සිට 2015.03.20 දින දක්වා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

**වැඩසටහන ප්‍රධාන අදියර 02 කින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.**

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටම.
- ජාතික මට්ටම.

**1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටම**

**ක්‍රියාත්මක කිරීම :-**

මෙම වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල සියලුම වසම් ආවරණය වන පරිදි කාන්තා දිනයට සමගාමීව එක් වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කළයුතු වේ. ( ප්‍රාදේශීය මට්ටම වෙනුවට දිස්ත්‍රික් මට්ටමින් එක් වැඩසටහනක් සංවිධානය කිරිමේ හැකියාව ඇත.) මෙහිදී කාන්තා නායකත්වයේ වැදගත්කම යළි සමාජ ගත කිරීම සඳහා නව නිර්මාණාත්මක අංග ඉදිරිපත් කිරීමට ද කටයුතු කළයුතු වේ. ඒ සඳහා පහත දැක්වෙන මග පෙන්වීම උපයෝගී කර ගත හැකි වේ.

**අපේක්ෂිත ක්‍රියාකාරකම් :-**

- හඳුනාගත් කාන්තාවන්ගේ ආකල්ප තවදුරටත් වර්ධනය කිරීම සඳහා සුදුසු සම්පත්දායකයෙකු මගින් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්විම.
- තෝරාගත් කාන්තාවන් පිරිසකට ව්‍යාපෘති ණය හා නිවාස ඉදිකිරීම සඳහා ප්‍රදානයන් කිරීම.
- ළමා සමාජ දරුවන්ගේ නර්ථන හා ගායන අංගයන් ඉදිරිපත් කිරීම.
- සමාජයේ යහපැවැත්ම සඳහා විවිධ ක්ෂේත්‍ර වලින් දායකත්වය ලබා දී ඇති කාන්තාවන්ද හැකි පමණ දායක කර ගැනීම සහ ඔවුන් ඇගයීම.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ජීවිතය ජයගත් කාන්තාවකගේ අත්දැකීම් ඉදිරිපත් කිරීම.

**සහභාගිත්වය:-**

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය ආවරණය වන පරිදි හඳුනාගත් කාන්තාවන් 100 ක් පමණ සහභාගී කිරීම සුදුසු වේ.

**වගකීම හා පසුවිපරම**

ප්‍රාදේශීය ලේකම්ගේ මග පෙන්වීම යටතේ මූලස්ථාන කළමණාකරු හා සමාජ සංවර්ධන සහකාර ඉහත සඳහන් වැඩසටහන සංවිධානය හා සම්බන්ධීකරණය කළයුතු වේ. ප්‍රාදේශීය වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ දැයි දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ විසින් අධීක්ෂණය කළයුතු වේ.

**වැය දැරීම:-**

ප්‍රාදේශීය වැඩසටහන් සඳහා සමාජ සංවර්ධන පදනමින් අරමුදල් (රු. 10,000/= උපරිමයකට යටත්ව) යොදවා ගත යුතු අතර, 2014.06.10 දින දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති පුහුණු වැඩසටහන් වලට අදාල ගෙවීම් උපදෙස්වලට අනුව එම මුදල් වැය කිරීමට කටයුතු කළ යුතුය.

මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සියළුම නිලධාරීන්ගේ සහභාගීත්වය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

2. **ජාතික මට්ටමේ වැඩසටහන ( එක්දින වැඩසටහනකි )**

මෙම වැඩසටහන 2015.03.08 වන දින හම්බන්තොට දිස්ත්‍රික්කයේදී පැවැත්වීමට සැලසුම් කර ඇත.

ජාතික මට්ටමේ වැඩසටහන පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් සමන්විතය.

- ජාත්‍යන්තර කාන්තා දිනය තේමා කර ගත් විද්වත් දේශන 2ක්.
- යෝජිත නව ණය වැඩසටහන හඳුන්වාදීම හා එයට අදාළ චෙක්පත් ප්‍රදානය.
- දිස්ත්‍රික්කයකින් තෝරාගත් එක් අයෙකු බැගින් සවිබල ගැන්වූ කාන්තාවන් විසිපස් දෙනෙකු ඇගයීම. (දිස්ත්‍රික්කයට අදාළ ඇගයීමට ලක් වන කාන්තාව තේරීම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ/ සමාජ සංවර්ධන විෂයය භාර කළමණාකරු වෙත පැවරේ).
- නිවාස සඳහා මූල්‍යාධාර ලබා දීමට (රු.75,000/-) තෝරා ගත් ප්‍රතිලාභින්ට හිමිකම් පත්‍ර පිරිනැමීම.

**සහභාගී වන්නන් තෝරා ගැනීම.**

එක් දිස්ත්‍රික්කයකින් 25 ක් බැගින් කාන්තාවන් 625 ක් සහභාගී කිරීමට අපේක්ෂා කෙරේ. මෙම කාන්තාවන් ප්‍රවාහනය හා උදෑසන ආහාර සඳහා දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හිම සමාජ සංවර්ධන පදනම්වල දායකත්වය ලබා ගත යුතු වේ. ජාතික උත්සවය සඳහා පැමිණෙන අයගේ නාම ලේඛණය 2015.03.03 දිනට පෙර සමාජ සංවර්ධන අංශයට ලැබීමට සලස්වන මෙන් දන්වමි.
( ෆැක්ස් 011 - 2876602 / 011 - 2876602, email- dddsocialho@gmail.com )

මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබ දක්වන සහයෝගය හා කැපවීම ඉතා අගය කොට සලකමි.

**ආර්.ඒ.ඒ.කේ. රණවක,**

**අධ්‍යක්ෂ ජනරාල්.**

පිටපත් :-

01. ලේකම්, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය. - කා.දැ.ගැ.ස.
02. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය. - කා.දැ.ගැ.ස.
03. ප්‍රධාන ගණකාධිකාරි, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව. - දැ.ගැ.ස. හා අ.ක.ස.
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව. - දැ.ගැ.ස. හා අ.ක.ස.
05. සියළුම අංශ ප්‍රධානීන්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව. - දැ.ගැ.ස. හා අ.ක.ස.